දිවි තොර කරගැනීම් සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් වාර්තා කිරීම, ඒ පිළිබඳව දැනුවත් බවක් ඇති කිරීම සඳහා අවශ්‍ය බවට විවාදයක් නොමැත. කෙසේ නමුත්, එසේ දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී, අනුකාරක දිවි තොර කරගැනීම් ඇති විය හැකි ආකාරයට වාර්තා නොකිරීම, මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් බවද එලෙසින්ම පැවසීමට සිදුවේ.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, දිවි තොර කරගැනීමක් වාර්තා කිරීමේදී පුවත්පතක ඇතුළු පිටුවක, පහළ කෙළවරට ආසන්නව පළ කරන මෙන් දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් පවසයි. මන්දයත්, අනවශ්‍ය ලෙසින් ප්‍රමුඛතාවයක් ලබාදෙමින් පළ කරන දිවි තොර කරගැනීමක් ඔස්සේ ඊට ලැබෙන අවධානය, අනුකාරක සිදුවීම් කෙරෙහි මඟ පෑදිය හැකි බැවිනි.

ඇමරිකාවේ සිට පැමිණි ඉංජිනේරුවරයෙකුගේ ඝාතනයත්, ඊට වගකිව යුතු යැයි සැකකෙරෙනා තවත් අයෙකුගේ දිවි තොර කරගැනීමත් පුවත්පත් දෙකක් ඔස්සේ පළ වී තිබූ ආකාරය මෙහිදී නිරීක්ෂණය කළ හැක.

එහිදී ලංකාදීප (ඔක්. 25, 2022) මෙය මුල් පිටුවේ ප්‍රධාන පුවත ලෙසින් ඉහළම ප්‍රමුඛතාවයක් සහිතව පළ කොට ඇත. අරුණ (ඔක්. 25, 2022) එය පළ කරන්නේ වඩා අවම ප්‍රමුඛතාවයක් ලබාදෙමින් 6 වැනි පිටුවේයි.

කෙසේ නමුත්, මෙම පුවත්පත් දෙකම එම පුවත් වාර්තාවන් සමඟින් හදිසි උපකාරක අංක පළ කර නැත. එසේම පුවත් වාර්තාවන් දෙකම තුළ දිවි තොර කරගැනීම සිදුවී ඇති ආකාරය ද සඳහන් කර ඇත.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ඔබගේ දුරකථනයටම ලබා ගන්න!

ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙක් වන්න!